**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2019**

------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල,කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව ,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසදීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරන තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් “මනා ලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ ප්‍රසිද්ධ ගිණුම් කටයුතුභාවය (Public accountability) සහිත ආයතන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර නොගත යුතු වුවද, ආයතනය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන තිබුණි. | ඔබ විසින් කරන ලද පැහැදිලි කිරීම් අනුව මෙම ආයතනය භාණ්ඩ විකුණන හෝ සේවා සපයන රාජ්‍ය සංස්ථාවක් නොවන නිසා තවදුරටත් ආයතනයේ මූල්‍ය වාර්තා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව පිළියෙල කළ යුතු බව අපගේ අදහස වේ. | 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත යටතේ ස්ථාපිත කර ඇති මෙම ආයතනය සේවා සපයන ආයතනයක් බව පනතේ 4 වගන්තියේ දක්වා ඇති අරමුණු අනුව පැහැදිලිවේ. එමෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත, භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ ප්‍රසිද්ධ ගිණුම් කටයුතුභාවය සහිත ආයතන සඳහා අදාල බව ප්‍රමිතියෙහි 1 කොටසෙහි පරිච්ඡේද 1.1 හා 1.2 අනුව පැහැදිලි වේ. ඒ අනුව |

| | | |
|---|---|---|
| | | ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත නිවැරැදිව අදාල කර ගත යුතුය. |
| (ආ) නිර්වචිත ප්‍රතිලාභ මැනීම සඳහා පුරෝකථනය කළ ඒකක ණය ක්‍රමය (projected unit credit method) භාවිතා කරන බව ගිණුම්කරණ සටහන් වල දක්වා තිබුණද සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල පරිච්ඡේද 28 හි 28.17 හා 28.18 වගන්ති ප්‍රකාරව ප්‍රතිලාභ වට්ටම් කිරීමක් සිදු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල පරිච්ඡේද 17 හි 17.15 A වගන්තිය ප්‍රකාරව,දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොකිරීම හේතුවෙන්, තවදුරටත් භාවිතයට ගනිමින් පවතින පිරිවැය රු. 12,582,309 ක් වූ වත්කම් 228 ක විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙසේ ශුන්‍ය වටිනාකමින් යුතු වත්කම් නැවත සකසා ගණනය කොට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වරද දිගින් දිගටම පෙන්වා දී ඇතත් නිවැරදි කිරීමට කටයුතු නොකිරීම කළමණාකරණ දුර්වලතාවයක් බැවින්, මෙම ගිණුම්කරණ දෝෂය නැවත ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ආයතන තත්ත්ව කළමනාකරණ පද්ධතිය වෙනුවෙන් 2018 සැප්තැම්බර් 14 සිට 2021 සැප්තැම්බර් 13 දක්වා වූ කාලසීමාවට අදාලව දරන ලද රු. 302,755 ක් වූ මුළු වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 201,837 ක් වැඩියෙන් හා ඉදිරියට | ඉදිරියේදී මේ සම්බන්ධව නිවැරදි කොට කටයුතු කිරීමට අප ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන පෞද්ගලික ආයතනයට දන්වා ඇත. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවීම් රු. 172,402 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | | |
| (ආ) 2013 සැප්තැම්බර් මාසයේ දී මුද්‍රණ ආයතනයට පවරා දී තිබූ හෙක්ටයාර් 0.1012 ක ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මෙගා පොලිස් අමාත්‍යාංශය විසින් මෙම ඉඩමෙන් යම් කොටසක් අත්පත් කරගන්නා බවට නිකුත් කර ඇති ප්‍රකාශයක් හේතුවෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සතුව පවතින මෙම ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට නොහැකි විය. | ආයතනය සතු වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,709,362 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,348,743 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,360,619 වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පාඨමාලා ආදායම වර්ධනය වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය විසින් ජාතික වෘත්තීය සුදුසුකම් සහිත එක් පාඨමාලාවක් ඇතුළු පාඨමාලා 13 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල සිසුන් 932 දෙනෙකු බඳවා ගෙනතිබුණු අතර ඉන් සිසුන් 111 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණි. 2019 වර්ෂය සඳහා ආයතනය පාඨමාලා 18 ක් සඳහා ලියාපදිංචි වී තිබූ නමුත් පාඨමාලා 09 ක් (පාඨමාලා වලින් සියයට 50) සඳහා සිසුන් 20 කට වඩා අඩුවෙන් ලියාපදිංචි වී තිබුණි. | අප ආයතනයේ සමහර පාඨමාලා සඳහා වසරකට සිසුන් 15 ත් 20 ත් අතර ප්‍රමාණයක් ඇතුල්වෙන අවස්ථා ඇත. එසේ සිදුවන්නේ ඒ ඒ පාඨමාලා වලට ඇති ඉල්ලුම අනුවය. මෙම පාඨමාලා හුදෙක්ම ක්ෂේත්‍රෙය් නියැලි පිරිසක් සඳහා පැවැත්වෙන තාක්ෂණික පාඨමාලා ගණයට අයත් වේ. | පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය අඩුවීම සහ පාඨමාලා හැරයාමට හේතු හඳුනාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර මෙම තත්ත්වය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) පාලක මණ්ඩල අනුමැතියකින් තොරව දැනට ආයතනයේ පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිනිය ඇතුලු තවත් නිලධාරීන් තිදෙනෙකු වෙත ආයතනයේ වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරීන් ලෙස සලකා රු. 50,000 බැගින් මුදල් ත්‍යාග 2019 වර්ෂයේ පැවති ත්‍යාග ප්‍රධාන උත්සවයේදී ලබා දී තිබුණි. එකී නිලධාරීන් ආයතනයේ ස්ථිර සේවකයින් නොවන බවත්, ඔවුන්ගේ වසර 20 ක සේවා කාලය සනාථ කිරීමට | 2019 වර්ෂය තුල පවත්වනු ලැබූ සහතිකපත් ප්‍රධාන උත්සවයේදී ත්‍යාග මුදල් ලෙස රු. 50,000 ක මුදලක් ලබාදී ඇත්තේ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය තුල වසර 20 ක් දේශකවරුන් ලෙස කටයුතු කල හතර දෙනෙක් වෙනුවෙන් ඔවුන් කල මහඟු සේවයට උපහාර වශයෙනි. | මෙම අවිධිමත් ගෙවීම තුලින් ආයතනයට සිදුවී ඇති අලාභය අයකිරීමට කටයුතු කළ යුතුය. |

අදාල ලේඛන ආයතනය සතු නොවන බවත්, රජයේ මුද්‍රණාලයාධිපතිනිය විසින් මෙම ගෙවීම අනුමත කර ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2017 නොවැම්බර් 01 දින සිට පුරප්පාඩුව පවතින ප්‍රධාන විධායක නිළධාරි තනතුර සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම්ලත් නිලධාරියකු බඳවා ගැනීමෙන් තොරව, එම තනතුරෙහි සේවය කර විශ්‍රාම ගොස් සිටි නිලධාරියා වසර 2 ක් සඳහා විධිමත් ක්‍රමවේදයකින් සහ අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි. ඒ සඳහා වැටුප් සහ වාහන දීමනා ලෙස එකතුව රු. 120,000 ක් ද ඉන්ධන ලීටර් 150 ක් ද ගෙවා තිබුණි. තවද 2019 නොවැම්බර් 01 දින සිට තවත් වසර දෙකකින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබූ අතර දීමනා තීරණය වූ ආකාරය සහ ඊට අදාල අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | මුද්‍රණ ආයතන පනත ප්‍රකාරව පාලක මණ්ඩලයට ඇති බලතල අනුව පාලක මණ්ඩල අනුමැතිය මත, මෙම නිලධාරියා සේවය කළ කාලපරිච්ඡේදයට අදාල කාර්යසාධනය සලකා බලා මෙම පත්කිරීම සිදුකර ඇත. එම කොන්ත්‍රාත් කාලය නිමවන විට, පාලක මණ්ඩලය ක්‍රියාත්මක නොවූ අතර අමාත්‍යතුමා විසින් නිලබලයෙන් පත්කළ සාමාජිකයින් අතරින් මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිනිය සභාපති ලෙස පත්කර තිබුණි. ඒ අනුව, පනතින් ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම පත්කිරීම මවිසින් සිදුකර ඇත.<br>පනතේ 17 වන ඡේදයට අනුව ප්‍රධාන විධායක නිලධාරියාගේ වේතන සහ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීමට පාලක මණ්ඩලයට බලය ඇත. | පනතට අනුව පත්කිරීමේ බලතල පවතිනුයේ පාලක මණ්ඩලයට වන අතර පත්වීමේ මුල් කාලපරිච්ඡේදයට අදාලව පාලක මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන අවස්ථාව වන විට පාලක මණ්ඩලයක් නොසිටි බැවින් ප්‍රධාන විධායක නිළධාරි තනතුර සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියට අනුව සුදුසුකම්ලත් නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කළයුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී /12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 ජුනි 15 දින දක්වා ප්‍රමාද කර තිබුණි. | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාලක මණ්ඩලය පත් කිරීම ප්‍රමාද වීම මෙම ප්‍රමාදයට හේතු විය. ඒ අනුව විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබන ගිණුම් වාර්තාවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට අත්සන් කර එවිය යුත් බැවින් මෙම ප්‍රමාදය සිදුවිය. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි 4 වන වගන්තිය අනුව එම ආයතනය ප්‍රධාන අරමුණු 07 ක් යටතේ ස්ථාපිත කර තිබුණු අතර ඉන් අරමුණු 03 ක් ඉටුකර ගැනීම සඳහා වූ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම පනතෙහි 5 ඡේදයේ (ඇ) වගන්තියෙහි ඇතුලත් වැඩසටහන් 05 ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය නිමවන විටත් මුද්‍රණ ආයතනයට නොහැකි වී තිබුණි. | පනතේ සඳහන් සමහර අරමුණු සකසා ඇත්තේ අනාගතයේ ආයතනයේ සිදුවන සංවර්ධන වැඩ කටයුතු හා සමගාමීවය. මෙම ආයතනයේ පාඨමාලා හඳුන්වාදීමේ සංවර්ධන වැඩ කටයුතු සඳහා බොහෝ දුරට ළඟා වී ඇති නමුත් යටිතල පහසුකම්වල කිසිදු වෙනසක් සිදු වී නැත. මේ පිළිබඳ අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර නව ගොඩනැගිල්ලක් ලැබීමෙන් අනතුරුව පනතේ සඳහන් අනෙකුත් අරමුණ කරා වසරෙන් වසර ළඟා වීමට හැකිවනු ඇත. | ආයතනය ආරම්භ කිරීමෙන් රජය අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීම මෙන්ම නවීන තාක්ෂණික දියුණුවත් සමඟ ක්ෂේත්‍රයේ ඉදිරි සංවර්ධනයට අවශ්‍ය වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |